*සැ. යු.*-2014.06.20 දින පළ වූ අංක 1,868 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,869 - 2014 ජූනි මස 27 වැනි සිකුරාදා - 2014.06.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1064 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1067 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ජූලි මස 18 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ජූලි මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. ඩී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

නීති නිලධාරි (විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

**මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය**

මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුරේ පවතින එක් පුරප්පාඩුවක් පිරවීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබාගන්නා අපේක්‍ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 6 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය පවත්වනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම්* :-

(i) *අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්* :
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම/ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) *පළපුරුද්ද* :
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර 03කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

(iii) *කායික සුදුසුකම්* :

සෑම අපේක්‍ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

(iv) *වෙනත් සුදුසුකම්* :
- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
- අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා වන සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.
- ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය අමතර සුදුසුකමක් වේ.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :-

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. නීති නිලධාරි III වැනි ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි පළමුවැනි වැනි කාර්යක්‍ෂමතා කඩඉම සමත් විය යුතු ය.

(iii) 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014ට අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාව ලබාගත යුතු අතර රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතු ය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලට ද මෙම පත්වීම යටත් වේ.

04. *වයස් සීමාව* :-
ඉල්ලුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

05. *වැටුප් පරිමාණය* :-
මෙම තනතුරට රු. 22,935 - 10 x 645 - 8 x 790- 17 x 1,050 - රු. 53,555 මාසික වැටුප් පරිමාණයක් හිමිය. (2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006හි SL - 1 - 2006 වැටුප් කාණ්ඩය)

06. ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය සඳහා පහත සඳහන් ලකුණු පරිපාටිය පදනම් කරගනු ලැබේ.

| | *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01. | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්** : | | 20 |
| | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය | | |
| | - පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 20 | |
| | - දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 15 | |
| | - දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 15 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා | 10 | |

සටහන.-ගෞරව සාමාර්ථයක් සමග අවසන් විභාගය සමත්වුවහොත් පමණක් ලකුණු 10 ලබාදිය යුතුයි.

(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ - උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම්වලින් එකක් සඳහා පමණක්)

| | | |
|---|---|---|
| 02. | **අතිරේක වෘත්තීය සුදුසුකම්** : | 15 |
| | පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්) | |
| | පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින්) | |

පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට නොඅඩු සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා
(එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින්)

03. **අතිරේක පළපුරුද්ද :** 30

නීතිඥවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද
මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02
එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30ක්
(මූලික සුදුසුකම ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයෙකු ලෙස කටයුතු කළ වසර 03ක සේවා කාලය හැර)

(අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගේ හෝ ජනාධිපති නීතිඥවරයෙකුගේ හෝ විනිසුරුවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය.)

04. පරිඝණක සාක්ෂරතාව 15

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්ව විද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හදාරා තිබීම සඳහා 15

රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා 10

රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා

- මාස 06/පැය 720 07
- මාස 03/පැය 360 05

05. **ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය :** 15

ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය /උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/නීතිවේදී උපාධිය 15
(අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතු ය)

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසර 01ක් හෝ පැය 1500) 10

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා

- මාස 06/පැය 720 07
- මාස 03/පැය 360 05

06. **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව :** 05

**මුළු ලකුණු :** 100

07. **අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයෙන්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල්පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,

08. *අයදුම් ඉදිරිපත් කිරීම :*

(i) අයදුම්පත් 2014.07.28 දිනට හෝ එදිනට "ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල්, වෙළඳ නාවික කටයුතු අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්යාලය, අංක 43/89, බ්‍රිස්ටල් ගොඩනැගිල්ල, 1 වන මහල, යෝක් වීදිය, කොළඹ 01" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 07 දක්වාත් 02 වන පිටුව අංක 08 සිට 12 දක්වාත්, 03 වන පිටුව අංක 13 දක්වාත්, වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙලවරේ "නීති නිලධාරි (ස්ථිර) තනතුර සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු හෝ රු. 22,935 ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතුය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(vi) මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම :-*

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ බඳවා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය.

2014 ජූනි මස 27 වැනි දින,
වරාය කාර්යාලය,
අංක 19, චෛත්‍ය පාර
කොළඹ 01.

**ආදර්ශ අයදුම් පත්‍රය**

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශයේ, වෙළඳ නාවික අධ්‍යක්‍ෂ ජනරාල්ගේ කාර්යාලයේ නීති නිලධාරි (විධායක සේවා ගණයේ ශ්‍රේණියේ) තනතුර සඳහා අයදුම්පත

01. අයදුම්කරුගේ නම :
මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.
සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :—————.

02. ලිපිනය හා දුරකථන අංකය :—————.
(a) කාර්යාලීය ලිපිනය :—————.
දුරකථන අංකය :—————.
(b) පෞද්ගලික ලිපිනය :—————.
දුරකථන අංකය :—————.
ජංගම දුරකථන අංකය :—————.

03. උපන් දිනය :

අවුරුද්ද :—————. මාසය :—————. දිනය :—————.

04. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :
අවුරුදු :—————. මාස :—————. දින :—————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.

07. විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග :—————.

08. අධ්‍යාපන සුදුසුකම් :—————.
(a) නීතිය පිළිබඳව උපාධිය ලබාගත් විශ්ව විද්‍යාලය, දිනය හා භාෂා මාධ්‍ය :—————.
(b) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු ලෙස දිවුරුම් දුන් දිනය :—————.

09. වෘත්තීය සුදුසුකම් :—————.

| විභාගය/ ඩිප්ලෝමාව | වර්ෂය | විෂයන් | සාමාර්ථය | ආයතනයේ/ විශ්වවිද්‍යාලයේ නම |
|---|---|---|---|---|
| | | | | |

10. පළපුරුද්ද පිළිබඳ විස්තර :

| සේවය කළ ආයතනය | තනතුර | සේවා කාලය |
|---|---|---|
| | | |

11. පරිගණක සාක්‍ෂරතාවය පිළිබඳ ලබා ඇති ප්‍රවීණතාව :
(a) උපාධිය :—————.
(b) ඩිප්ලෝමාව :—————.
(c) සහතිකපත්‍ර පාඨමාලාව :—————.

12. ඉංග්‍රීසි භාෂාව සඳහා ලබා ඇති ප්‍රවීණතාව :
(a) උපාධිය :—————.
(b) ඩිප්ලෝමාව :—————.
(c) සහතිකපත්‍ර පාඨමාලාව :—————.

13. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියේ වරදකරු වී තිබේද ?

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ නිවැරදි නොවන බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් නුසුදුස්සෙක් වීමට යටත් වන බවත්, පත් කිරීමෙන් පසු ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොලබා සේවයෙන් පහ කිරීමටත් යටත් වන බවත් මම දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය
(දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්තවූවන් සඳහා පමණක් අදාල වේ.)

මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන .................. මයා/මිය/මෙනෙවිය දැනට ......... තනතුරේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක වන බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :—————.

06-785

**බදුල්ල දිස්ත්‍රික්කයේ හාලි ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හාලිඇල කොට්ඨාසයේ මාලිගාතැන්න උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර්ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ ගැසට් නිවේදනය අවලංගු කිරීමයි**

අංක 1866 සහ 2014.06.06 දිනැති *ගැසට් පත්‍රයේ* පළ වූ පහත සඳහන් කොට්ඨාසය සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ නිවේදනය මෙයින් අවලංගු කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 ජූනි මස 06 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| බදුල්ල | හාලිඇල | බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇල කොට්ඨාසයේ මාලිගාතැන්න උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල. |

06-680

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**අධ්‍යාපන අමාත්‍යාංශය**

සහකාර නේවාසිකාගාර පාලක/පාලිකා සහ සහකාර ශිෂ්‍ය නිවාසාධිකාරී/නිවාසාධිකාරිණී තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ජාතික පාසැල් සඳහා නේවාසිකාගාර පාලක/පාලිකා තනතුරු සඳහා සහ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨවල සහකාර ශිෂ්‍ය නිවාසාධිකාරී/නිවාසාධිකාරිණී තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඉහත සඳහන් සහකාර නේවාසිකාගාර පාලක/පාලිකා තනතුරු පුරප්පාඩු ජාතික පාසැල්වල පවතින අතර සහකාර ශිෂ්‍ය නිවාසාධිකාරී/නිවාසාධිකාරිණී තනතුරු පුරප්පාඩු ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පවතී.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත විභාගයක ප්‍රතිඵල අනුව කුසලතා මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් පත් කිරීම සඳහා තෝරාගනු ලැබේ. විභාගය කොළඹ නගරය ආශ්‍රිතව පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල පවත්වනු ලැබේ.

03. *වැටුප* .— අංක 06/2006 (IV) 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 සේවා ගණයේ III, II, හා I වැනි ශ්‍රේණියට අදාළ වැටුප් පරිමාණය රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 රු. 22,040

රු. 14,570 න් ඔබ්බට යෑම සඳහා II වැනි ශ්‍රේණියට උසස් වීම ද රු. 16,440 න් ඔබ්බට යාම සඳහා පළවෙනි ශ්‍රේණියට උසස් වීමද ලබාගත යුතුය.

04. *තනතුරේ ස්වභාවය.*— ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය.

05. *අධ්‍යාපන සුදුසුකම්.*— සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ගණිතය ඇතුළුව වෙනත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම,

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ දී අවම වශයෙන් එක් විෂයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

06. *කායික සුදුසුකම්.*— මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

07. අනෙකුත් සුදුසුකම් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
III. සුදුසුකම් ලබන දිනය.
තනතුරට පත් කිරීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති දිනය ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත සඳහන් සියළුම සුදුසුකම් සපුරා

ඇති දිනය වේ. මෙම දිනය අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය හෝ ඊට පෙර දිනයක් විය යුතුය.

08. *වයස.*— අවම සීමාව අවුරුදු 18
උපරිම සීමාව අවුරුදු 30

09. *විභාග පරිපාටිය.*— මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | | ලකුණු | කාලය |
|---|---|---|---|
| I. | සාමාන්‍ය දැනීම | 100 | පැය 01 |
| II. | සිංහල/දෙමළ භාෂාව | 100 | පැය 01 |

සාමාර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණු සංඛ්‍යාවෙන් අවම වශයෙන් 40% ක් බැගින් ලබා ගත යුතු වේ.

*සාමාන්‍ය දැනීම.*—තනතුරට අදාළ රාජකාරි ඉටු කිරීමට අවශ්‍ය සාමාන්‍ය දැනීම පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලබන බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

*සාමාන්‍ය දැනීමේ ප්‍රශ්න පත්‍රයේ සාරාංශය.*—නේවාසික සිසුන්ගේ විනය, ආරක්ෂාව, සුබ සාධනය හා ආහාර සැපයීම යන කටයුතු ඉටු කිරීම සම්බන්ධව ශිෂ්‍ය නිවාසාධිකාරිට සහය දැක්වීම.

*නේවාසික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සුබ සිද්ධිය.*—නේවාසික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ භාරකරු ලෙස කටයුතු කිරීම විනය පවත්වාගෙන යාම, ආහාර ද්‍රව්‍ය මිලයට ගැනීමට අදාළ පොත් පත් ලේඛන පවත්වාගෙන යාම, ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම, ආරක්ෂා කිරීම හා මුළුතැන්ගෙයට නිකුත් කිරීම පිළිබඳ කටයුතු ආහාර පාන පිසීම පිළිබඳ පරීක්ෂා කිරීම මුලුතැන්ගෙයි මෙවලම් පිළිබඳ පවිත්‍රතාවය, නේවාසිකාගාර පිරිසිදුව තැබීමට විධිවිධාන යෙදීම, රෝගාතුර වූ සිසුන් සම්බන්ධ කටයුතු (ප්‍රථමාධාර ලබා දීමේ කටයුතු) රජය සතු දේ හා සිසුන් සතු දේ ආරක්ෂා කිරීම පිළිබඳ කටයුතු කාල සටහන ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු නේවාසිකාගාර වල ජලය විදුලිය විධිමත්ව සැපයීමට අදාළ කටයුතු නේවාසිකයන් නේවාසිකාගාරයෙන් බැහැර වීම සහ පැමිණීම පිළිබඳ අදාළ කාර්යයන්

*සිංහල/දෙමළ භාෂාව.*—අපේක්ෂකයින්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනීම පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්න පත්‍රයකි. (සිංහල හෝ දෙමළ අ.පො. ස. (සාමාන්‍ය පෙළ) මට්ටම සියලු ප්‍රශ්න වලට ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතු ආකාරයෙන් ප්‍රශ්න සකස් කෙරේ.

09.1 *ප්‍රතිඵල නිකුත් කිරීම .*— එක් එක් විෂයට ලකුණු 40%කට නොඅඩුව ලබා සමත් අයදුම්කරුවන්ගේ කුසලතාවය අනුව සකස් කරන ලද මුළු ලකුණු ඇතුළත් ප්‍රතිඵල ලේඛනයක් ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. එයට අමතර වශයෙන් විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත විභාගයේ දී එක් එක් විෂයය සඳහා ලබාගත් ලකුණු හා මුළු ලකුණු ඇතුළත් ප්‍රතිඵල ලේඛනයක් පෞද්ගලිකව ලබාදෙනු ඇත.

10.

10.1 *පුරප්පාඩු සඳහා බඳවා ගැනීම.*—උක්ත තනතුරු සඳහා පවතින පුරප්පාඩු මත එම පුරප්පාඩුව පවතින ජාතික පාසලට හෝ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට පත්වීම් ලබා දීම සිදු කරනු ලැබේ. අයදුම්කරුවන් තම අයදුම්පත්‍රයේ තමා පත්වීම ලබා ගැනීමට අපේක්ෂා කරන සේවා ස්ථාන තුනක් ප්‍රමුඛතා අනුපිළිවෙලින් සටහන් කළ යුතුය. යම් හෙයකින් ඔබ පත්වීම ලැබීමට සුදුසුකමක් ලදහොත් තමා පත් කරනු ලබන සේවා ස්ථානයේ වසර 05ක් අවම වශයෙන් සේවය කිරීමට බැඳී සිටිනු ඇත.

පුරප්පාඩු ලේඛනය ජාතික පාසැල් - ඇමුණුම 01
පුරප්පාඩු ලේඛනය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ - ඇමුණුම 02 හි සඳහන් වේ.

10.2 *අයදුම් කිරීමේ ක්‍රමය.*— මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් නිවැරදිව සම්පූර්ණ කොට 2014.07.25 දින හෝ ඊට පෙර ලැබෙන සේ

විභාග කොමසාරිස් ජනරාල්
සංවිධාන හා විදේශ විභාග ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත
බත්තරමුල්ල, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඉල්ලුම්පත්‍රය බහාලන කවරයේ වමත් පස ඉහළ කෙලවරේ ඉල්ලුම්කරන තනතුරු නාමය අදාළ වන පරිදි සඳහන් කළ යුතුය.

ඉල්ලුම්පත්‍රයේ අනු අංක 1 සිට 8.1 තෙක් පළමුවන පිටුවට ද 8.2 සිට ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර, අසම්පූර්ණ තොරතුරු සඳහා කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන බව ද, ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව ද, ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂය සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍ර වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම් පත්‍ර වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීමට අවශ්‍ය වේ.

10.3 *විභාග ගාස්තු .*— විභාග ගාස්තුව රු. 500 කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 2003-02-13 යටතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට්පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජන සඳහා ළඟ තබා ගත යුතුයි) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

11. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

12. අයදුම්පත් ඉදිරිපත් කළ සෑම අයදුම්කරුවෙකුටම විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ලැබේ. අපේක්ෂකයෙකු හට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම හෝ ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලටද විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින දෙකක් හෝ තුනක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද ලියා පදිංචි කළ කුවිතාන්සියද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක්ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

13. සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කරුණක් සම්බන්ධව තීරණය කිරීමේ බලය අධ්‍යාපන ලේකම් සතුවේ.

අනුර දිසානායක
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2014 ජූනි මස 05 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
පැලවත්ත,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත්‍රය

අධ්‍යාපන අමාත්‍යාංශය

සහකාර නේවාසිකාගාර පාලක/පාලිකා සහ සහකාර ශිෂ්‍ය නිවාසාධිකාරී/නිවාසාධිකාරිණී තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014

Open Competitive Examination for Recruitment to the posts of Assistant Matron (Male/Female) and Assistant Hostel Superintendent (Male/Female)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා )

ඉල්ලුම් කරන තනතුර
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

සහකාර නේවාසිකාගාර පාලක/පාලිකා 01
සහකාර ශිෂ්‍ය නිවාසාධිකාරී/අධිකාරිණී 02
සහකාර නේවාසිකාගාර පාලක/පාලිකා හා සහකාර ශිෂ්‍ය නිවාසාධිකාරී/අධිකාරිණී 03

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
(අදාල අංකය කොටුව තුළ ලියන්න)
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

01. 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) උදා :SUNIL J. M. U.

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. 2.1 ස්ථිර ලිපිනය :————.

2.2 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.3 දුරකථන අංකය :

03. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය (ස්ත්‍රී - 1 පුරුෂ - 0 )
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන්දිනය :

වර්ෂය මාසය දිනය

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. විවාහක/අවිවාහක බව :————.

06. පදිංචි පළාත :————.

07. පදිංචි දිස්ත්‍රික්කය :————.

08. අධ්‍යාපන සුදුසුකම් :
8.1 අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය පිළිබඳ විස්තර
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *වර්ෂය* |
|---|---|---|
| | | |

8.2 අ.පො.ස උසස් පෙළ විභාගය පිළිබඳ විස්තර :
(i) විභාගයේ වර්ෂය හා මාසය
(ii) විභාග අංකය
(iii) ප්‍රතිඵල

| *විෂයය* | *ශ්‍රේණිය* | *වර්ෂය* |
|---|---|---|
| | | |

09. වෘත්තීය සුදුසුකම් :————.

10. පළපුරුද්ද :————.

11. වෙනත් සුදුසුකම් :————.

12. පත්වීම් ලබා ගැනීමට අපේක්ෂා කරන සේවා ස්ථාන :————.

| ප්‍රමුඛතා අනුපිළිවෙල | සේවා ස්ථානය | |
|---|---|---|
| | ජාතික පාසැල් | විද්‍යාපීඨ |
| 01 | | |
| 02 | | |
| 03 | | |

13. ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? :————.

14. විභාග ගාස්තු ගෙවූ ලදු පත පිළිබඳ විස්තර :

13.1 විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
13.2 ලදුපත් අංකය හා දිනය :————.
13.3 ගෙවූ මුදල :————.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න |
|---|

15. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

(ඇ) තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

16. මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................ .මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිටදී ............ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිලමුද්‍රාවෙන් සනාථ කරන්න.)

පුරප්පාඩු පවතින ජාතික පාසල් - සහකාර නේවාසිකාගාර පාලක තනතුරු

**බස්නාහිර පළාත**

ජාතික පාසල

1. වේල්ස් කුමර මහා විද්‍යාලය - මොරටුව
2. හංවැල්ල රාජසිංහ මහා විද්‍යාලය - හංවැල්ල
3. රාජකීය විද්‍යාලය - කොළඹ 07
4. ආනන්ද විද්‍යාලය - කොළඹ 10
5. නාලන්දා විද්‍යාලය - කොළඹ 10
6. තක්ෂිලා මධ්‍ය විද්‍යාලය - හොරණ
7. අල් හුමයිසරා මධ්‍ය මහා විද්‍යාලය - බේරුවල
8. සී. ඩබ්. ඩබ්. කන්නංගර මධ්‍ය මහා විද්‍යාලය - මතුගම
9. මහින්ද රාජපක්ෂ විද්‍යාලය - හෝමාගම
10. ඩී, එස්. සේනානායක ජාතික පාසල - කොළඹ 07

**දකුණු පළාත**

ජාතික පාසල

1. මහින්ද විද්‍යාලය - ගාල්ල
2. රිච්මන්ඩ් විද්‍යාලය - ගාල්ල
3. සිරිධම්ම විද්‍යාලය - ගාල්ල
4. රාහුල විද්‍යාලය - මාතර
5. විජිත මධ්‍ය මහා විද්‍යාලය - දික්වැල්ල
6. දෙණියාය මධ්‍ය මහා විද්‍යාලය - දෙණියාය
7. සහිරා මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලය -හම්බන්තොට
8. අරෆා මධ්‍ය මහා විද්‍යාලය - වැලිගම
9. තෙලිජ්ජවිල මධ්‍ය මහා විද්‍යාලය - තෙලිජ්ජවිල
10. මහින්ද රාජපක්ෂ විද්‍යාලය - මාතර
11. රාජපක්ෂ විද්‍යාලය - හම්බන්තොට

**මධ්‍යම පළාත**

ජාතික පාසල

1. ධර්මරාජ විද්‍යාලය - මහනුවර
2. කිංස්වුඩ් මහා විද්‍යාලය - මහනුවර
3. වික්‍රමබාහු මධ්‍ය මහා විද්‍යාලය - ගම්පොල
4. වලපනේ ශ්‍රී සුමංගල මධ්‍ය මහා විද්‍යාලය - නිල්දණ්ඩාහින්න
5. පොරමඩුල්ල මහා විද්‍යාලය - රිකිල්ලගස්කඩ
6. දඹුල්ල මධ්‍ය මහා විද්‍යාලය - දඹුල්ල
7. නුගවෙල මධ්‍ය මහා විද්‍යාල - නුගවෙල

**ඌව පළාත**

ජාතික පාසල

1. පස්සර මධ්‍ය මහා විද්‍යාලය - පස්සර
2. කන්දෙගෙදර මධ්‍ය මහා විද්‍යාලය - හාළිඇල
3. වැලිමඩ මහා විද්‍යාලය - වැලිමඩ
4. මහානාම මධ්‍ය මහා විද්‍යාලය - මොණරාගල
5. මල්වත්තාවල මධ්‍ය මහා විද්‍යාලය - වැල්ලවාය

**වයඹ පළාත**

ජාතික පාසල්

1. අල් අක්ෂා ජාතික පාසල - කල්පිටිය
2. මලියදේව පිරිමි විද්‍යාලය - කුරුණෑගල
3. ඉබ්බාගමුව මධ්‍ය මහා විද්‍යාලය - ඉබ්බාගමුව
4. මයුරපාද මධ්‍ය මහා විද්‍යාලය - නාරම්මල
5. සඳලංකාව මධ්‍ය මහා විද්‍යාලය - සඳලංකාව
6. විජයබා මධ්‍ය මහා විද්‍යාලය - මහව
7. කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලය - කුලියාපිටිය
8. සේනානායක මධ්‍ය මහා විද්‍යාලය - මාදම්පෙ
9. කැකුනගොල්ල මධ්‍ය මහා විද්‍යාලය - කැකුනගොල්ල

**නැගෙනහිර පළාත**

ජාතික පාසල්

1. කින්නියා මධ්‍ය මහා විද්‍යාලය - කින්නියාව
2. ඩී. එස්. සේනානායක ජාතික පාසල - අම්පාර
3. දෙහිඅත්තකණ්ඩිය ජාතික පාසල - අම්පාර
4. අල් අස්රක් මධ්‍ය මහා විද්‍යාලය - නින්තාවූර්
5. කාත්තන්කුඩි මධ්‍ය මහා විද්‍යාලය - කාත්තන්කුඩි
6. අක්කරෙයිපත්තු මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලය
7. සහිරා විද්‍යාලය - කල්මුනේ
8. ත්‍රි/ශාන්ත ජෝශප් විද්‍යාලය - ත්‍රිකුණාමලය

**උතුරු පළාත**

ජාතික පාසල්

1. යාපනය මධ්‍ය මහා විද්‍යාලය - යාපනය
2. යාපනය හින්දු විද්‍යාලය - යාපනය
3. සිතිවිනයාගර් හින්දු විද්‍යාලය - මන්නාරම
4. වව්නියාව දෙමළ මධ්‍ය මහා විද්‍යාලය - වව්නියාව
5. මානිප්පායි හින්දු විද්‍යාලය - යාපනය
6. නෙල්ලිඅඩි මධ්‍ය මහා විද්‍යාලය - කරවඩි

**සබරගමුව පළාත**

ජාතික පාසල්

1. සීවලී මධ්‍ය මහා විද්‍යාලය - රත්නපුර
2. කරවිට මධ්‍ය මහා විද්‍යාලය - උඩකරවිට
3. පින්නවල මධ්‍ය මහා විද්‍යාලය - රඹුක්කන
4. ඩඩ්ලි සේනානායක මධ්‍ය මහා විද්‍යාලය - තෝලංගමුව
5. රිවිසඳ මධ්‍ය විද්‍යාලය - උස්සාපිටිය
6. රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලය - රුවන්වැල්ල

**උතුරු මැද පළාත**

ජාතික පාසල්

1. අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලය - අනුරාධපුර
2. රාජකීය මධ්‍ය මහා විද්‍යාලය - පොළොන්නරුව
3. කැකිරාව මධ්‍ය මහා විද්‍යාලය - කැකිරාව
4. සහිරා මුස්ලිම් විද්‍යාලය - අනුරාධපුරය
5. මෛත්‍රීපාල සේනානායක මධ්‍ය මහා විද්‍යාලය - මැදවච්චිය

**පුරප්පාඩු පවතින ජාතික පාසල් - සහකාර නේවාසිකාගාර පාලිකා තනතුරු**

**බස්නාහිර පළාත**

ජාතික පාසල්

1. හංවැල්ල රාජසිංහ මහා විද්‍යාලය - හංවැල්ල
2. දේවි බාලිකා විද්‍යාලය - කොළඹ 08
3. විශාඛා විද්‍යාලය - කොළඹ 04
4. මුස්ලිම් බාලිකා විද්‍යාලය - කොළඹ 04
5. ආනන්ද බාලිකා විද්‍යාලය - කොළඹ 10
6. වේයන්ගොඩ බණ්ඩාරනායක මධ්‍ය මහා විද්‍යාලය - වේයන්ගොඩ
7. නිව්ස්ටඩ් බාලිකා විද්‍යාලය - මීගමුව
8. තක්ෂිලා මධ්‍ය විද්‍යාලය - හොරණ
9. සී. ඩබ්. ඩබ්. කන්නංගර මධ්‍ය මහා විද්‍යාලය - මතුගම
10. මහින්ද රාජපක්ෂ විද්‍යාලය - හෝමාගම
11. සිරිමාවෝ බණ්ඩාරනායක බාලිකා විද්‍යාලය - කොළඹ 07
12. අළුත්ගමවීදිය මුස්ලිම් බාලිකා විද්‍යාලය - අළුත්ගම

**දකුණු පළාත**

ජාතික පාසල්

1. රිපන් බාලිකා විද්‍යාලය - ගාල්ල
2. සවුත්ලන්ඩ් විද්‍යාලය - ගාල්ල
3. සිරිධම්ම විද්‍යාලය - ගාල්ල
4. ක්‍රිස්තුදේව බාලිකා විද්‍යාලය - බද්දේගම
5. සුජාතා විද්‍යාලය - මාතර
6. අරාෆා මධ්‍ය මහා විද්‍යාලය - වැලිගම
7. විජිත මධ්‍ය මහා විද්‍යාලය - දික්වැල්ල
8. තෙලිජ්ජවිල මධ්‍ය මහා විද්‍යාලය - තෙලිජ්ජවිල
9. දෙණියාය මධ්‍ය මහා විද්‍යාලය - දෙණියාය
10. රාජපක්ෂ විද්‍යාලය - හම්බන්තොට
11. සහිරා මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලය - හම්බන්තොට
12. මහින්ද රාජපක්ෂ විද්‍යාලය - මාතර
13. සංඝමිත්තා බාලිකා විද්‍යාලය - ගාල්ල

**මධ්‍යම පළාත**

ජාතික පාසල්

1. උසස් බාලිකා විදුහල - මහනුවර
2. මහාමායා බාලිකා විදුහල - මහනුවර
3. පුෂ්පදාන බාලිකා විද්‍යාලය - මහනුවර
4. වලපනේ ශ්‍රී සුමංගල මධ්‍ය මහා විද්‍යාලය - නිල්දණ්ඩාහින්න
5. පොරමඩුල්ල මහා විද්‍යාලය - රිකිල්ලගස්කඩ
6. දඹුල්ල මධ්‍ය මහා විද්‍යාලය - දඹුල්ල
7. වික්‍රමබාහු මධ්‍ය මහා විද්‍යාලය - ගම්පල
8. නුගවෙල මධ්‍ය මහා විද්‍යාලය - නුගවෙල
9. සංඝමිත්තා බාලිකා විද්‍යාලය - මාතලේ

**ඌව පළාත**

ජාතික පාසල්

1 ඩී. එස්. සේනානායක මධ්‍ය මහා විද්‍යාලය - කන්දෙකැටිය
2. විශාඛා බාලිකා මහා විද්‍යාලය - බණ්ඩාරවෙල
3. කුඩාකුසුම් බාලිකා මහා විද්‍යාලය - බණ්ඩාරවෙල

4. වැලිමඩ මහා විද්‍යාලය - වැලිමඩ
5. මහානාම මධ්‍ය මහා විද්‍යාලය - මොණරාගල
6. වෙල්ලස්ස මධ්‍ය මහා විද්‍යාලය - බිබිල
7. පස්සර මධ්‍ය මහා විද්‍යාලය - පස්සර
8. කන්දෙගෙර මධ්‍ය මහා විද්‍යාලය - හාලිඇල
9. මල්වත්තාවල මධ්‍ය මහා විද්‍යාලය - වැල්ලවාය

**වයඹ පළාත**

ජාතික පාසල්

1 අල් අක්ෂා ජාතික පාසල - කල්පිටිය
2 මලියදේව බාලිකා විද්‍යාලය - කුරුණෑගල
3 ඉබ්බාගමුව මධ්‍ය මහා විද්‍යාලය - ඉබ්බාගමුව
4 කැකුනගොල්ල මධ්‍ය මහා විද්‍යාලය - කැකුන්ගොල්ල
5 සඳලංකාව මධ්‍ය මහා විද්‍යාලය - සඳලංකාව
6 විජයබා මධ්‍ය මහා විද්‍යාලය - මහව
7 මහසෙන් මධ්‍ය මහා විද්‍යාලය - නිකවැරටිය
8 කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලය - කුලියාපිටිය
9 සේනානායක මධ්‍ය මහා විද්‍යාලය - මාදම්පෙ
10 මයුරපාද මධ්‍ය මහා විද්‍යාලය - නාරම්මල
11 පරාක්‍රමබාහු මධ්‍ය මහා විද්‍යාලය - පොල්ගහවෙල

**නැගෙනහිර පළාත**

ජාතික පාසල්

1 වින්සන්ට් උසස් බාලිකා විද්‍යාලය - මඩකලපුව
2 දෙහිඅත්තකන්ඩිය ජාතික පාසල - අම්පාර
3 ශාන්ත මරියා ජාතික පාසල - ත්‍රිකුණාමලය
4 ඩී. එස්. සේනානායක ජාතික පාසල - අම්පාර
5 අල් අස්රක් මධ්‍ය මහා විද්‍යාලය - නින්තවූර්
6 කාත්තන්කුඩි මධ්‍ය මහා විද්‍යාලය - කාත්තන්කුඩි
7 අක්කරෙපත්තු මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලය - අක්කරෙපත්තු
8 සහිරා විද්‍යාලය - කල්මුනේ

**උතුරු පළාත**

ජාතික පාසල්

1 සිතිවිනයාගර් හින්දු විද්‍යාලය - මන්නාරම
2 වව්නියාව දෙමළ මධ්‍ය මහා විද්‍යාලය - වව්නියාව
3 නෙල්ලිඅඩි මධ්‍ය මහා විද්‍යාලය - කරවඩි

**සබරගමුව පළාත**

ජාතික පාසල්

1. ෆර්ගසන් උසස් විද්‍යාලය - රත්නපුර
2. සුමන බාලිකා විද්‍යාලය - රත්නපුර
3. සීවලී මධ්‍ය මහා විද්‍යාලය - රත්නපුර
4. කරවිට මධ්‍ය මහා විද්‍යාලය - උඩකරවිට
5. කෑගලු බාලිකා මහා විද්‍යාලය - කෑගල්ල
6. පින්නවල මධ්‍ය මහා විද්‍යාලය - රඹුක්කන
7. රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලය - රුවන්වැල්ල
8. රිවිසඳ මධ්‍ය මහා විද්‍යාලය - උස්සාපිටිය
9. ඩඩ්ලි සේනානායක මධ්‍ය මහා විද්‍යාලය - තෝලංගමුව

**උතුරු මැද පළාත**

ජාතික පාසල්

1. අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලය - අනුරාධපුර
2. කැකිරාව මධ්‍ය මහා විද්‍යාලය - කැකිරාව
3. මෛත්‍රීපාල සේනානායක මධ්‍ය මහා විද්‍යාලය - මැදවච්චිය
4. රාජකීය මධ්‍ය මහා විද්‍යාලය - පොළොන්නරුව
5. සහිරා මුස්ලිම් විද්‍යාලය - අනුරාධපුර
6. ස්වර්ණපාලී බාලිකා මහා විද්‍යාලය - අනුරාධපුරය

**පුරප්පාඩු පවතින ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ (සහකාර ශිෂ්‍ය නිවාසාධිකාරී - ගැහැණු)**

විද්‍යාපීඨයන්

1. පස්දුන්රට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
2. සියනෑ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
3. යාපනය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
4. මහවැලි ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
5. නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
6. ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
7. හාපිටිගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
8. රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
9. රුහුණ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
10. අඩ්ඩාලච්චේන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
11. වයඹ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
12. වව්නියා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
13. දර්ගා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
14. මඩකලපුව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
15. ඌව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
16. පුලතිසිපුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
17. දඹදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
18. පේරාදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය

**පුරප්පාඩු පවතින ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ (සහකාර ශිෂ්‍ය නිවාසාධිකාරී - පිරිමි)**

විද්‍යාපීඨයන්

1. පස්දුන්රට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
2. සියනෑ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
3. යාපනය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
4. මහවැලි ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
5. නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
6. ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
7. හාපිටිගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
8. රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
9. රුහුණ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
10. අඩ්ඩාලච්චේන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
11. වයඹ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
12. වව්නියා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
13. මඩකලපුව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
14. ඌව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
15. පුලතිසිපුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
16. සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
17. දඹදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
18. පේරාදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය

### පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ සැලසුම් ශිල්පී තනතුරේ පුරප්පාඩුව සඳහා එක් වසරක පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීම - 2014**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ සැලසුම් ශිල්පී තනතුරේ පුරප්පාඩුව සඳහා එක් වසරක පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *විභාගය* :-

2014 සැප්තැම්බර් මාසයේ දී ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අනුකූලව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

03. *සේවා කොන්දේසි* :

රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, මෙහි පහත සඳහන් කොන්දේසිවලට ද, යටත්ව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ සැලසුම් ශිල්පී තනතුරේ එක් වසරක පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

(i) විවෘත බඳවා ගැනීම් යටතේ පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගන්නා නිලධාරීන්, සේවයට අදාළ විෂය නිර්දේශය අනුව ලබා ගන්නා එක් වසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිමකොට අදාළ විභාගය සමත්වීමෙන් පසු III ශ්‍රේණියේ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ඇත.

(ii) එසේ III ශ්‍රේණියට ඇතුළත් කිරීමෙන් පසු, වසර 3ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ තනතුරක සේවය කරන ලද නිලධාරියෙකු පත් කරනු ලැබුවහොත්, එක් වසරක වැඩ බැලීමේ කාල සීමාවකට යටත් කරනු ලැබේ. විවෘත බඳවා ගැනීම් තුළින් පත් කරනු ලබන නිලධාරීන් තනතුරේ ස්ථිර කිරීමට පෙරාතුව, නියමිත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව තිබීම ද අවශ්‍ය වේ.

(iii) පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගන්නා නිලධාරීන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද, ආයතන සංග්‍රහයේ විධි විධාන වලට ද, මුදල් රෙගුලාසි වලට ද, කාර්ය පරිපාටික රීතිවලට ද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසි වලටත් යටත් වේ.

04. *වැටුප් පරිමාණය* :

MN-3-2006A- සැලසුම් ශිල්පී III ශ්‍රේණිය
රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 -රු. 27,885
(රා. පරි. ච. ලේ. 07/2008 අනුව මාසික)

මෙම වැටුප් පරිමාණයේ රු. 15,005 - 4 x 180 - 6 x 240 -රු. 17,165/- වැටුප් පියවරයන් මෙම ශ්‍රේණියට හිමිවේ.

III ශ්‍රේණියේ නිලධාරීන් තුන්වැනි වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

පුහුණු කිරීමේ ශ්‍රේණියේ දීමනා රා. පරි. ච. 6/2006(II) අනුව -
1 වසර රු. 12,920.00
2 වසර රු. 13040.00

05. *වයස් සීමාව* :

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවු. 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

06. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්* :

*අධ්‍යාපන සුදුසුකම්* :

ක්ෂේත්‍රයට අදාළ විෂයයන් වන සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ගණිත විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ. පො. ස. (උ. පෙළ) විභාගය එකවර සමත්වීම;

*සහ*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*වෘත්තීය සුදුසුකම්* :

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම;

*හෝ*

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. (ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට අදාළ සහතිකය ලබා තිබිය යුතුය)

*කායික සුදුසුකම්* :

මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්වය වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ විය යුතු ය.

*වෙනත්* :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය;

(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය;

(iii) සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ, අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

07. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත තරඟ විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

ලිඛිත විභාගය :

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ.

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු පරිමාණය* | *සමත් ලකුණු පරිමාණය* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | පැය 01 | 100 | 40 |

08. *විභාගය :*

(i) මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

(ii) අපේක්ෂකයින් කැමති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක.

(iii) ඉල්ලීම් කරන ලද භාෂා මාධ්‍ය විභාගයේ දී වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(iv) විභාග ගාස්තුව රු. 400 කි.

(v) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට නිකුත් කරන ලද පේරාදෙණිය, තැපැල් කාර්යාලයෙන් මුදල් කර ගත හැකි වනසේ ලබාගත් මුදල් ඇනවුමක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතු ය.

(vi) විෂය නිර්දේශය :

(අ) *බුද්ධි පරීක්ෂණය :*
අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත් ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය.

(ආ) *පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) :*

1. ගණිතය - ගණිතමය දැනුම පිළිබඳ මූලික සිද්ධාන්ත හා ක්‍රියාවලි -
* මෙට්‍රික් ඒකක, සම්මත ඒකක පරිවර්තනය,
* දිග, වර්ග ඵලය, පරිමාව, ධාරිතාවය පිළිබඳ මිනුම් ගැනීම,
* සාමාන්‍ය ප්‍රතිශත අගය ගණනය කිරීම,
* සෘජු රේඛා දී ඇති සංඛ්‍යාවකට අදාළව සමාන හෝ දෙකක් හෝ දෙකකට වැඩි කොටස් බවට පත් කිරීම.

2. ප්‍රමාණ ගැනීම-
ආදර්ශ සැලසුම් වලින් සපයනු ලබන ගොඩනැගිලි හා වෙනත් සරල ව්‍යුහවලට අදාළ ප්‍රමාණ ගැනීම.

3. මූලික ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු හා නඩත්තු-
* අත්තිවාරම්, බිත්ති, ව්‍යුහ කොටස්, වහලය, සීලිම, දොර හා ජනේල, බිම හා බිත්ති නිමැවුම් කටයුතු සඳහා ගොඩනැගිලි ඉදිකිරීම්වලදී භාවිතා කරන අමුද්‍රව්‍ය,
* වැඩ බිම් කළමනාකරණයේ තත්ත්ව පාලනය,
* වැඩබිම් කාර්යාලයේ සිට පවත්වාගෙන යා යුතු ලිපිලේඛන.

4. ජල සම්පාදන හා ජල පවහන-
* ජල සම්පාදන (ජල මූලාශ්‍ර, ජල නල අමුද්‍රව්‍ය සහ භාවිතා කරන උපාංග, සියලු අත්‍යාවශ්‍ය උපාංග ඇතුළත් නල එලීම),
* පල්දෝරු/ජල ප්‍රවාහන (රෙගුලාසි, ජල ප්‍රවාහන උපාංග, වැසිකිළි පෝච්චි, උගුල, ගලි, වාතාශ්‍රය, මනුවලවල් හා වෙනත් අංග බැහැර කිරීම දක්වා).

09. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය :*

ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනය සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. 8 1/2 x 12 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කර ගත් ඉල්ලුම්පත්‍රය 2014.07.14 දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සැලසුම් ශිල්පී" තනතුරට බඳවා ගැනීමේ තරඟ විභාගය යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන :-*

(i) රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

(ii) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී ඉල්ලුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(iii) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. විභාගය පැවැත්වෙන දිනය පුවත්පත් දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ. ඉල්ලුම්කරුවන්ට විභාග ප්‍රවේශපත්‍රය විභාගය පැවැත්වෙන දිනයට දින හතරකට කලින් නොලැබුණහොත් පහත සඳහන් විස්තර ඇතිව වහාම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට දැන්විය යුතු ය.

i. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.

ii. ලිපිනය :————.

iii. ඉල්ලුම්පත් තැපැල් කිරීමේ දිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය :————.

10. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය.

i. උප්පැන්න සහතිකය,
ii. අධ්‍යාපන සුදුසුකම් තහවුරු කිරීමේ සහතික,

*අපේක්ෂකයාගේ අනන්‍යතාවය ඃ*

විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාග ශාලාවේ දී තමාගේ අනන්‍යතාව විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඔප්පුකර සිටිය යුතු ය. ඒ සඳහා පහත ලේඛන පිළිගැනේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රය,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය (විභාග දිනට අවුරුදු 3කට කලින් නිකුත් කරන ලද)

*සාවද්‍ය තොරතුරු සැපයීම ඃ*

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හැකි වන්නේය. අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැන ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු සේවයෙන් පහ කිරීමට යටත් වන්නේය.

මෙම ගැසට් පත්‍රයේ 03 වැනි ඡේදයේ ප්‍රකාශිත රාජ්‍ය සේවයට පත්කිරීමට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි හා විභාග අපේක්ෂිකයින් සඳහා නීති හා උපදෙස් කෙරෙහි අවධානය යොමු කර ඒවා පිළිපැදිය යුතු ය.

11. මෙම ගැසට් නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් ද තීරණයක් ගැනීමේ බලය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතුවේ. එය අවසන් තීරණය වේ.

වෛද්‍ය ඩබ්. කේ. ද සිල්වා,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය
අධ්‍යක්ෂ ජනරාල්.

2014 ජූනි මස 03 වැනි දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

**_පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය_**

**_සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව_**

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ සැලසුම් ශිල්පී තනතුරේ එක් වසරක පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා අයදුම්පත**

| | |
|---|---|
| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය | |

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ කොටුව තුළ අංකය ලියන්න)

01. නම ඃ

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම ඃ (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————. (උදා ඃ SILVA B. A.)

1.2 සම්පූර්ණ නම සිංහලෙන් :————.

1.3 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

02. ලිපිනය ඃ
පෞද්ගලික :————.
රාජකාරි ලිපිනය :————.
ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය: ————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය ඃ (අදාළ කොටුව තුළ (✓) සළකුණු කරන්න.)

3.1 ස්ත්‍රී [ ]
පුරුෂ [ ]

3.2 උපන් දිනය ඃ

වර්ෂය ඃ | | | | | මාසය ඃ | | | දිනය ඃ | | |

3.3 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස ඃ

අවුරුදු ඃ | | | | | මාස ඃ | | | දින ඃ | | |

3.4 විවාහක/අවිවාහක බව (අදාළ අංකය කොටුව තුළ සළකුණු කරන්න.)
විවාහක ඃ [ ]
අවිවාහක ඃ [ ]

04. අධ්‍යාපන සුදුසුකම් ඃ

4.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය ඃ

වර්ෂය :————. මාසය :————.

| *විෂයය* | *ලබාගත් සාමාර්ථය* | *විභාග අංකය* |
|---|---|---|
| | | |

4.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය ඃ

වර්ෂය :————. මාසය :————.

| *විෂයය* | *ලබාගත් සාමාර්ථය* | *විභාග අංකය* |
|---|---|---|
| | | |

4.3 වෘත්තීය සුදුසුකම් ලබාගත් ආයතනය :—————.

4.4 වෘත්තීය සුදුසුකම් ලබාගත් වර්ෂය :—————.

05. වර්තමාන රැකියාව හා කලින් දැරූ පත්වීම් : (ඇත්නම් පමණක්)

| තනතුර | ආයතනය | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

06. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලයේ නම :—————.
මුදල් ඇණවුම් අංකය :—————.

සම්පූර්ණ විභාග ගාස්තුව රු. 400 කි. දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට ගෙවන කාර්යාලය :- පේරාදෙණිය.

කුවිතාන්සිය මෙහි අලවන්න.

07. මෙම ඉල්ලුම්පත්‍රයේ ම විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවටත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන්ට පමණක් අදාළ වේ.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම දෙපාර්තමේන්තුවේ ................................... ලෙස සේවය කරන ................. මයා/මිය/මෙනවිය විසින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, අපේක්ෂකයා/අපේක්ෂිකාව ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා,
(නිල මුද්‍රාව තැබිය යුතුය)

පදවි නාමය :—————.
ලිපිනය :—————.
දිනය :—————.

06-681

**පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය**

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පශු සම්පත් සංවර්ධන නිලධාරි තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීම - 2014**

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ, පශු සම්පත් සංවර්ධන නිළධාරි තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *විභාගය* :

2014 සැප්තැම්බර් මාසයේ දී සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් මහනුවර දී මෙම විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

03. *සේවා කොන්දේසි* :

රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, මෙහි පහත සඳහන් කොන්දේසිවලට ද, යටත්ව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පශු සම්පත් සංවර්ධන නිලධාරි තනතුරේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

(i) පත්කරනු ලබන නිලධාරියා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

(ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

(iii) බඳවාගනු ලබන නිලධාරීන් වසර 3ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු පත් කරනු ලැබුවහොත්, එක් වසරක වැඩ බැලීමේ කාල සීමාවකට යටත් කරනු ලැබේ. විවෘත බඳවා ගැනීම් තුලින් පත් කරනු ලබන නිලධාරීන් තනතුරේ ස්ථිර කිරීමට පෙරාතුව, නියමිත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව තිබීම ද අවශ්‍ය වේ.

(iv) රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවකට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාවයක් සේවයට බැඳී වසර 05ක් තුළ ලබාගත යුතු ය.

(v) පත්වීම් ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද, කාර්ය පරිපාටික රීතිවලට ද, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලටත් යටත් වේ.

04. *වැටුප් පරිමාණය* :

MN-3-2006A- පශු සම්පත් සංවර්ධන නිලධාරි තනතුරේ III ශ්‍රේණියේ
රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 -රු. 27,885
(රා. පරි. ච. ලේ. 07/2008 අනුව මාසික),

මෙම වැටුප් පරිමාණයේ රු. 15,005 - 4 x 180 - 6 x 240 -රු. 17,165/- වැටුප් පියවරයන් මෙම ශ්‍රේණියට හිමිවේ.

III ශ්‍රේණියේ නිලධාරීන් තුන්වැනි වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

05. වයස් සීමාව :-
අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවු. 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

06. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :*

අධ්‍යාපන සුදුසුකම් :

රසායන විද්‍යාව, කෘෂිකර්ම විද්‍යාව හා ජීව විද්‍යාව යන විෂයයන් අතරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ගණිත විෂය ධාරාවන්ට අයත් විෂයයන් තුනකින් අ. පො. ස. (උ. පෙළ) විභාගය එකවර සමත්වීම;

සහ

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

වෘත්තීය සුදුසුකම් :

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු සත්ත්ව පාලන ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;

*හෝ*

සත්ත්ව පාලන ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම ;

*හෝ*

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

*සටහන.*—ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර පූර්ව සුදුසුකම් ලබාගෙන තිබිය යුතු ය. ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඉදිරිපත්කරන ඉල්ලුම්පත් වලංගු නොවේ.

කායික සුදුසුකම් :

මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්වය වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මඟින් සනාථ විය යුතු ය.

වෙනත් :

(i) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

(iii) සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ, අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

07. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුලු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

ලිඛිත විභාගය :-
මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ.

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු පරිමාණය* | *සමත් ලකුණු පරිමාණය* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | පැය 01 | 100 | 40 |

08. *විභාගය :*

(i) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

(ii) අපේක්ෂකයින් කැමති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක.

(iii) ඉල්ලීම් කරන ලද භාෂා මාධ්‍යය විභාගයේ දී වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(iv) විභාග ගාස්තුව රු. 400 කි.

(v) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට නිකුත් කරන ලද, පේරාදෙණිය තැපැල් කාර්යාලයෙන් මුදල් කර ගත හැකි වනසේ ලබාගත් මුදල් ඇණවුමක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතු ය.

(vi) විෂය නිර්දේශය :

(*අ*) බුද්ධි පරීක්ෂණය :—
අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයන් ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයන් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත ය.

(*ආ*) පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය)

(i) ශ්‍රී ලංකා කෘෂිකාර්මික හා සත්ව පාලන කටයුතු පිළිබඳ පවත්නා සම්පත්, විභවයන් වර්තමාන තත්ත්වයන් හා ආර්ථිකයට ඇති දායකත්වය;

(ii) ශ්‍රී ලංකාවේ සත්ව නිෂ්පාදන රටා, නිෂ්පාදන ප්‍රමාණයන් හා අලෙවිකරණ ක්‍රම ශ්‍රී ලංකාවේ පවතින සත්වපාලන ගොවිපල රටා ඒවායේ පිහිටීම හා විසිරීම;

(iii) ගොවිපල සතුන් අභිජනනය සඳහා බහුලව යොදාගන්නා ක්‍රම;

(iv) බෝවෙන සත්ව රෝග, සත්ව රෝග මර්ධන ක්‍රියා පිළිවෙත්, රෝගී සතුන්ගේ නියැදි රැස්කිරීම හා ප්‍රවාහනය;

(v) ඒකාබද්ධ ගොවිපළ ක්‍රම හා ප්‍රතිචක්‍රීය කරන ක්‍රම,

(vi) සත්වපාලන හා ආශ්‍රිතව කර්මාන්ත කිරි සැකසීම, මස් සැකසීම, සත්ව ආහාර නිෂ්පාදනය,

(vii) සත්ව නිෂ්පාදන ක්‍රියාවලියට අදාල ආදායම් වියදම් ගණනය ක්‍රම, ගොවිපල් වාර්තා කරණය හා ගිණුම් විශ්ලේෂණය, සත්ව ගොවිපල් සැලසුම් කරණය,

(viii) විද්‍යාත්මක තොරතුරු ප්‍රචාරණ ක්‍රම භාවිතය හා ඒවායේ ඵලදායිතාවයන්.

09. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය :*

(i) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනය සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. 8 1/2" x 12" (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කර ගත් ඉල්ලුම්පත්‍රය 2014 ජුලි මස 14 වැනි දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "පශු සම්පත් සංවර්ධන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ තරඟ විභාගය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන :-*

(i) රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

(ii) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී ඉල්ලුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(iii) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. විභාගය පැවැත්වෙන දිනය පුවත්පත් දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ. ඉල්ලුම්කරුවන්ට විභාග ප්‍රවේශපත්‍රය විභාගය පැවැත්වෙන දිනයට දින හතරකට කලින් නොලැබුනහොත් පහත සඳහන් විස්තර ඇතිව වහාම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට දැන්විය යුතු ය.

i. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.

ii. ලිපිනය :————.

iii. ඉල්ලුම්පත් තැපැල් කිරීමේ දිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය :————.

10. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය.

i. උප්පැන්න සහතිකය,
ii. අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් තහවුරු කිරීමේ සහතික,

*අපේක්ෂකයාගේ අනන්‍යතාවය :-*

විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාග ශාලාවේ දී තමාගේ අනන්‍යතාවය විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඔප්පුකර සිටිය යුතු ය. ඒ සඳහා පහත ලේඛන පිළිගැනේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් නිකුත් කරන ලද ජාතික හැඳුනුම් පත්‍රය,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

*සාවද්‍ය තොරතුරු සැපයීම :*

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හැකි වන්නේය. අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැන ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු සේවයෙන් පහ කිරීමට යටත් වන්නේය.

මෙම *ගැසට් පත්‍රයේ* 03 ඡේදයේ ප්‍රකාශිත රාජ්‍ය සේවයට පත්කිරීමට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි හා විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් කෙරෙහි අවධානය යොමු කර ඒවා පිළිපැදිය යුතු ය.

11. මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් ද විභාගය මගින් බඳවා ගත යුතු අපේක්ෂක සංඛ්‍යාව සම්බන්ධයෙන් ද තීරණයක් ගැනීමේ බලය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතුවේ. එය අවසන් තීරණය වේ.

වෛද්‍ය ඩබ්. කේ. ද සිල්වා,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය
අධ්‍යක්ෂ ජනරාල්.

2014 ජුනි මස 02 වැනි දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

***පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය***

***සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව***

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ පශු සම්පත් සංවර්ධන නිලධාරි තනතුර සඳහා අයදුම්පත**

| | |
|---|---|
| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය | |

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

01. නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————. (උදා : SILVA B. A.)

1.2 සම්පූර්ණ නම සිංහලෙන් :————.

1.3 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

02. ලිපිනය :
පෞද්ගලික :————.
රාජකාරි :————.
ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය: ————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය : (අදාළ කොටුව තුළ සළකුණු කරන්න.)

3.1 ස්ත්‍රී
පුරුෂ

3.2 උපන් දිනය :

වර්ෂය මාසය දිනය

3.3 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස :

අවුරුදු මාස දින

3.4 විවාහක/අවිවාහක බව (අදාළ අංකය කොටුව තුළ (✓) සළකුණු කරන්න.)

විවාහක
අවිවාහක

04. අධ්‍යාපන සුදුසුකම් :

4.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :

වර්ෂය :————. මාසය :————.

| විෂයය | ලබාගත් සාමාර්ථය | විභාග අංකය |
|---|---|---|
| | | |

4.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය

වර්ෂය :————. මාසය :————.

| විෂයය | ලබාගත් සාමාර්ථය | විභාග අංකය |
|---|---|---|
| | | |

4.3 (අ) වෘත්තීය සුදුසුකම් ලබාගත් ආයතනය :————.

4.4 (ආ) වෘත්තීය සුදුසුකම් ලබාගත් වර්ෂය :————.

05. වර්තමාන රැකියාව හා කලින් දැරූ පත්වීම් *(ඇත්නම් පමණක්)*

| තනතුර | ආයතනය | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

06. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලයේ නම :————.
මුදල් ඇණවුම් අංකය :————.

සම්පූර්ණ විභාග ගාස්තුව රු. 400 කි. දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට ගෙවන කාර්යාලය :- පේරාදෙණිය.

කුවිතාන්සිය මෙහි අලවන්න.

07. මෙම ඉල්ලුම්පත්‍රයේ ම විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවටත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන්ට පමණක් අදාළ වේ.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම දෙපාර්තමේන්තුවේ ................................... ලෙස සේවය කරන ................. මයා/මිය/මෙනවිය විසින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත් ඒවා නිවැරදි බවත් අපේක්ෂකයා/අපේක්ෂිකාව ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා,
(නිල මුද්‍රාව තැබිය යුතුය)

පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

06-682/1

---

**පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීම - 2014**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *විභාගය :*

2014 සැප්තැම්බර් මාසයේ දී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් මහනුවර දී මෙම විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය

කල් දැමීමට හෝ අවලංගු කිරීමට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

03. *සේවා කොන්දේසි :*

රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසි වලට ද, මෙහි පහත සඳහන් කොන්දේසිවලට ද, යටත්ව පර්යේෂණ සහකාර තනතුරේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

(i) පත්කරනු ලබන නිලධාරියා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

(ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

(iii) බඳවාගනු ලබන නිලධාරීන් වසර 3ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු පත් කරනු ලැබුවහොත්, එක් වසරක වැඩ බැලීමේ කාල සීමාවකට යටත් කරනු ලැබේ. විවෘත බඳවා ගැනීම් තුළින් පත් කරනු ලබන නිලධාරීන් තනතුරේ ස්ථිර කිරීමට පෙරාතුව, නියමිත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව තිබීමද අවශ්‍ය වේ.

(iv) රාජ්‍ය සේවයට බඳවාගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවකට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් සේවයට බැඳී වසර 05ක් තුළ ලබාගත යුතු ය.

(v) පත්වීම් ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද, කාර්ය පරිපාටික රීති වලට ද, ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් වරින්වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලටත් යටත් වේ.

04. *වැටුප් පරිමාණය :*

MN-3-2006A- පර්යේෂණ සහකාර තනතුරේ III ශ්‍රේණියේ
රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 -රු. 27,885
(රා. පරි. ච. ලේ. 07/2008 අනුව මාසික)

මෙම වැටුප් පරිමාණයේ රු. 15,005 - 4 x 180 - 6 x 240 -රු. 17,165/- වැටුප් පියවරයන් මෙම ශ්‍රේණියට හිමිවේ.
III ශ්‍රේණියේ නිලධාරීන් තුන්වැනි වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

05. වයස් සීමාව :-
අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවු. 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

06. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :*

අධ්‍යාපන සුදුසුකම් :

රසායන විද්‍යාව, කෘෂිකර්ම විද්‍යාව හා ජීව විද්‍යාව යන විෂයයන් අතරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ගණිත විෂය ධාරාවන්ට අයත් විෂයයන් තුනකින් අ. පො. ස. (උ. පෙළ) විභාගය එකවර සමත්වීම,

*සහ*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම,

වෘත්තීය සුදුසුකම් :

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු සත්ත්ව පාලන ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,

*හෝ*

සත්ත්ව පාලන ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

*හෝ*

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්‍ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්‍ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්‍ෂණික සුදුසුකම් ලබා තිබීම.

සටහන : ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර පූර්ව සුදුසුකම් ලබාගෙන තිබිය යුතුය. ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඉදිරිපත්කරන ඉල්ලුම්පත් වලංගු නොවේ.

කායික සුදුසුකම් :

මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්වය වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මඟින් සනාථ විය යුතුය.

වෙනත් :

(i) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය,

(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය,

(iii) සේවයට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ, අයදුම්කරු අදාළ සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

07. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත තරඟ විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

ලිඛිත විභාගය :-
මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ.

| විෂයයන් | කාලය | උපරිම ලකුණු පරිමාණය | සමත් ලකුණු පරිමාණය |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්‍ෂණය | පැය 01 | 100 | 40 |
| 2. පොදු පරීක්‍ෂණය (තාක්‍ෂණ හා විෂයානුබද්ධ පරීක්‍ෂණය) | පැය 01 | 100 | 40 |

08. *විභාගය* :1

(i) මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

(ii) අපේක්‍ෂකයින් කැමති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක.

(iii) ඉල්ලීම කරන ලද භාෂා මාධ්‍යය විභාගයේ දී වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(iv) විභාග ගාස්තුව රු. 400 කි.

(v) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල් නමට නිකුත් කරන ලද පේරාදෙණිය, තැපැල් කාර්යාලයෙන් මුදල් කර ගත හැකිවන සේ ලබාගත් මුදල් ඇනවුමක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතු ය.

(vi) විෂය නිර්දේශය :

(අ) බුද්ධි පරීක්‍ෂණය :
අපේක්‍ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයන්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයන් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

(ආ) පොදු පරීක්‍ෂණය (තාක්‍ෂණ හා විෂයානුබද්ධ පරීක්‍ෂණය)

(i) රසායනාගාර උපකරණ හඳුනාගැනීම හා නඩත්තුව;

(ii) රෝග විනිශ්චය සඳහා යොදා ගන්නා පරීක්‍ෂණ ක්‍රම (ව්‍යාධි වේද, පරපෝෂිත වේද, ක්ෂුද්‍ර ජීව වේද, මස්තු වේද, පෝෂණ);

(iii) තත්ත්ව පාලනය සඳහා යොදා ගන්නා පරීක්‍ෂණ ක්‍රම (භෞතික පරීක්‍ෂණ, රසායනික පරීක්‍ෂණ, සංවේදතා පරීක්‍ෂණ);

(iv) රසායනාගාර පවිත්‍රතාව, විෂබීජහරණය.

(v) සාම්පල් ලබාගැනීම, ගබඩා කිරීම, ප්‍රවාහනය

09. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(i) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනය සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. 8 1/2 x 12 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කර ගත් ඉල්ලුම්පත්‍රය 2014.07.14 දිනට පෙර අධ්‍යක්‍ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීමේ තරඟ විභාගය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන* :-

(i) රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

(ii) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී ඉල්ලුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(iii) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. විභාගය පැවැත්වෙන දිනය පුවත්පත් දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ. ඉල්ලුම්කරුවන්ට විභාග ප්‍රවේශපත්‍රය, විභාගය පැවැත්වෙන දිනයට දින හතරකට කලින් නොලැබුනහොත් පහත සඳහන් විස්තර ඇතිව වහාම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල්ට දැන්විය යුතු ය. :

i. අපේක්‍ෂකයාගේ සම්පූර්ණ නම :————.
ii. ලිපිනය :————.
iii. ඉල්ලුම්පත් තැපැල් කිරීමේ දිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය :————.

10. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය. :

i. උප්පැන්න සහතිකය,
ii. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් තහවුරු කිරීමේ සහතික,

අපේක්‍ෂකයාගේ අනන්‍යතාවය :-

විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාග ශාලාවේ දී තමාගේ අනන්‍යතාව විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඔප්පුකර සිටිය යුතු ය. ඒ සඳහා පහත ලේඛන පිළිගැනේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රය,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය (විභාග දිනට අවුරුදු 03කට කලින් නිකුත් කරන ලද)

සාවද්‍ය තොරතුරු සැපයීම :

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා යම් අපේක්‍ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක හෝ ඔහුගේ අපේක්‍ෂකත්වය අවලංගු කිරීමට හැකි වන්නේය. අපේක්‍ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැන ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු සේවයෙන් පහ කිරීමට යටත් වන්නේය.

මෙම ගැසට් පත්‍රයේ 03 ඡේදයේ ප්‍රකාශිත රාජ්‍ය සේවයට පත්කිරීමට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි හා විභාග අපේක්‍ෂකයින් සඳහා නීති හා උපදෙස් කෙරෙහි අවධානය යොමු කර ඒවා පිළිපැදිය යුතු ය.

11. මෙම ගැසට් නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් ද විභාගය මගින් බඳවා ගත යුතු අපේක්ෂක සංඛ්‍යාව සම්බන්ධයෙන් ද තීරණයක් ගැනීමේ බලය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතුවේ. එය අවසන් තීරණය වේ.

වෛද්‍ය ඩබ්. කේ. ද සිල්වා,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය
අධ්‍යක්ෂ ජනරාල්.

2014 ජුනි මස 02 වැනි දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

***පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය***

*සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව*

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ පර්යේෂණ සහකාර නිලධාරි තනතුර සඳහා අයදුම්පත**

| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය : | |
|---|---|

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ කොටුව තුළ ලියන්න)

01. නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————. (උදා : SILVA B. A.)

1.2 සම්පූර්ණ නම සිංහලෙන් :————.

1.3 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

02. ලිපිනය :
පෞද්ගලික :————.
රාජකාරි ලිපිනය :————.
ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය: ————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය : (අදාළ කොටුව තුළ සළකුණු කරන්න.)

3.1 ස්ත්‍රී
පුරුෂ

3.2 උපන් දිනය :

වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

3.3 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස :

අවුරුදු : | | | | | මාස : | | | දින : | | |

3.4 විවාහක/අවිවාහක බව : (අදාළ අංකය කොටුව තුළ සළකුණු කරන්න.)
විවාහක
අවිවාහක

04. අධ්‍යාපන සුදුසුකම් :

4.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය :

වර්ෂය :————. මාසය :————.

| *විෂයය* | *ලබාගත් සාමාර්ථය* | *විභාග අංකය* |
|---|---|---|
| | | |

4.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

වර්ෂය :————. මාසය :————.

| *විෂයය* | *ලබාගත් සාමාර්ථය* | *විභාග අංකය* |
|---|---|---|
| | | |

4.3 වෘත්තීය සුදුසුකම් ලබාගත් ආයතනය :————.

4.4 වෘත්තීය සුදුසුකම් ලබාගත් වර්ෂය :————.

05. වර්තමාන රැකියාව හා කලින් දැරූ පත්වීම් (ඇත්නම් පමණක්)

| *තනතුර* | *ආයතනය* | *සිට* | *දක්වා* |
|---|---|---|---|
| | | | |

06. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලයේ නම :————.
මුදල් ඇණවුම් අංකය :————.

සම්පූර්ණ විභාග ගාස්තුව රු. 400 කි. දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට ගෙවන කාර්යාලය :- පේරාදෙණිය.
කුවිතාන්සිය මෙහි අලවන්න.

07. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වුත්, නිවැරදි වුත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවටත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන්ට පමණක් අදාළ වේ.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම දෙපාර්තමේන්තුවේ .................................. ලෙස සේවය කරන ................. මයා/මිය/මෙනවිය විසින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත් ඒවා නිවැරදි බවත් අපේක්ෂකයා/අපේක්ෂිකාව ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා,
(නිල මුද්‍රාව තැබිය යුතුය)

පදවි නාමය :————.

ලිපිනය :————.

දිනය :————.

06-682/2

---

**සංශෝධනයයි**

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සේවා මධ්‍යස්ථාන ලිපිකරු සේවයේ III වන ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2013 (2014)

උක්ත කරුණ සම්බන්ධයෙන් 2014.02.07 දිනැතිව නිකුත් කරන ලද අංක 1849 දරන *ගැසට් නිවේදනය* හා බැඳේ.

02. ඒ අනුව, එකී නිවේදනයේ අංක 3 යටතේ 3.4 ඡේදයේ සඳහන් "අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවු. 18ට නොඅඩු හා 30ට නොවැඩි විය යුතු ය. දැනටමත් රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බල නොපායි" යන වගන්තියේ "දැනටමත් රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බල නොපායි." යන්න ඉවත් විය යුතු ය.

03. 2014.02.07 දිනැතිව නිකුත් කරන ලද අංක 1849 දරන *ගැසට් නිවේදනය* පරිදි දැනටමත් රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු, වයස අවු. 30ට වැඩි යම් නිලධාරියෙකු/නිලධාරිණියක උක්ත විභාගය සඳහා අයදුම් කර ඇත්නම්, එම නිලධාරීන් ඒ බව සනාථ කිරීම සඳහා අවශ්‍ය තම අයදුම්පත්‍රයේ ඡායා පිටපත සහ අදාළ විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ පිටපත 2014.08.01 දින හෝ එදිනට පෙර මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබීමට කටයුතු කළ යුතුයි. එසේ අයදුම්කර ඇති සියලු අපේක්ෂකයින් වෙත, තමන් විභාග ගාස්තු වශයෙන් මෙම දෙපාර්තමේන්තුව වෙත ගෙවන ලද මුළු මුදල නැවත ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා ඇත.

එම්. ඒ. එස්. වීරසිංහ,
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

2014 ජුනි මස 11 වැනි දින.

06-786/1

---

**සංශෝධනයයි**

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර III වන ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2012 (2013)

උක්ත කරුණ සම්බන්ධයෙන් 2013.10.04 දිනැතිව නිකුත් කරන ලද අංක 1831 දරන *ගැසට් නිවේදනය* හා බැඳේ.

02. ඒ අනුව, එකී නිවේදනයේ අංක 3 යටතේ 3.4 ඡේදයේ සඳහන් "අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවු. 18ට නොඅඩු හා 30ට නොවැඩි විය යුතු ය. දැනටමත් රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බල නොපායි" යන වගන්තියේ "දැනටමත් රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බල නොපායි." යන්න ඉවත් විය යුතු ය.

03. 2013.10.04 දිනැතිව නිකුත් කරන ලද අංක 1831 දරන *ගැසට් නිවේදනය* පරිදි දැනටමත් රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු, වයස අවු. 30ට වැඩි යම් නිලධාරියෙකු/නිලධාරිණියක උක්ත විභාගය සඳහා අයදුම් කර ඇත්නම්, එම නිලධාරීන් ඒ බව සනාථ කිරීම සඳහා අවශ්‍ය තම අයදුම් පත්‍රයේ ඡායා පිටපත සහ අදාළ විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ පිටපත 2014.07.14 දින හෝ එදිනට පෙර මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබීමට කටයුතු කළ යුතුය. එසේ අයදුම් කර ඇති සියලු අපේක්ෂකයින් වෙත, තමන් විභාග ගාස්තු වශයෙන් මෙම දෙපාර්තමේන්තුව වෙත ගෙවන ලද මුළු මුදල නැවත ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා ඇත.

එම්. ඒ. එස්. වීරසිංහ,
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

2014 ජුනි මස 11 වැනි දින.

06-786/2

සංශෝධනයයි

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013 (2014)

2014.06.06 වැනි දින පළ කරන ලද උක්ත විභාගයට අදාළ නිවේදනයේ, අංක 15 ලිඛිත විභාගයේ විෂයය නිර්දේශය යටතේ අංක (02), "ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ප්‍රවණතා" යටතේ,

(කාලය පැය 03 යි - ලකුණු 100 යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.)" ලෙසට පළ වී ඇත. එය,

(කාලය පැය 03 යි - ලකුණු 100 යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ලෙසින් සංශෝධනය විය යුතු ය.

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

2014 ජූනි මස 18 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

06-81

---

සංශෝධනයයි

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා මුද්‍රණ සේවයේ විධායක නිලධාරි ගණයේ I පන්තියේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත/විවෘත තරග විභාගය - 2012**

අංක 1866 හා 2014.06.06 දිනැති රජයේ *ගැසට් පත්‍රයේ* පල කරන ලද රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා මුද්‍රණ සේවයේ විධායක නිලධාරි ගණයේ 1 පන්තියේ 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත /විවෘත තරග විභාගයට අදාළ නිවේදනයේ අභ්‍යන්තර අයදුම්පත් කැඳවීම වෙනුවෙන් සකස් කරන ලද ආදර්ශ අයදුම් පත්‍රය පහත පරිදි සංශෝධනය කරන බව සියලුම අයදුම්කරුවන් වෙත මෙයින් දැනුම් දෙමි.

අභ්‍යන්තර අයදුම්කරුවන් තම අයදුම්පත්, අංක 1.0 සිට 3.11 දක්වා ශීර්ෂ පළමුවන පිටුවට ද, 4.0 සිට 8.0 දක්වා ශීර්ෂ දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද ගෙන සකස් කළ යුතු ය.

චරිත හේරත්,
ලේකම්,
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය.

2014 ජූනි මස 23 වැනි දින.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

***රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා මුද්‍රණ සේවයේ විධායක නිලධර ගණයේ I වැනි පංතියේ III වැනි ශ්‍රේණියේ සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (නිෂ්පාදන), සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (නඩත්තු - මුද්‍රණ යාන්ත්‍රික), සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (නඩත්තු - ඉලෙක්ට්‍රොනික), සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (මුද්‍රණ සංස්කාරක) යන තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2012***

**ඉල්ලුම්පත්‍රය**

**Application for the Limited Competitive Examination for Recruitment to Executive Service Cadre Class I Grade III in the Printing Service, Assistant Government Printer (Production), Assistant Government Printer (Maintenance - Printing - Mechanical), Assistant Government Printer (Maintenance - Electronics), Assistant Government Printer (Printing Editor) in the Department of Government Printing - 2012**

1.0 මාධ්‍යය :
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.1 ඔබ විසින් ඉල්ලුම්කරනු ලබන තනතුර :

සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (නිෂ්පාදන) - 01
සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (නඩත්තු - මුද්‍රණ යාන්ත්‍රික) - 02
සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (නඩත්තු - ඉලෙක්ට්‍රොනික) - 03
සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (මුද්‍රණ සංස්කාරක) - 04
(ඔබ ඉල්ලුම් කරනු ලබන තනතුරට අයත් අංකය හිස් කොටුව තුළ සඳහන් කරන්න.)

2.2 ඔබ විසින් විවෘත තරග විභාගය සඳහා අයදුම්පත් යොමු කිරීමට බලාපොරොත්තු වන්නේ ද ? :————.

3.0 පෞද්ගලික තොරතුරු :

3.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) *උදාහරණ :* (SILVA, A. B.)

3.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

3.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

3.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

3.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

3.6 ස්ත්‍රී/පුරුෂ භාවය (පුරුෂ - 0, ස්ත්‍රී - 1) :
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

3.7 විවාහක/අවිවාහක බව :
(අවිවාහක - 1, විවාහක -2)

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.8 ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

3.9 උපන් දිනය : වර්ෂය ☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.10 ඉල්ලුම්පත් භාරගන්නා
අවසාන දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

3.11 දුරකථන අංකය (තිබේ නම්) :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

4.0 සුදුසුකම් පිළිබඳ තොරතුරු :

4.1 ඔබ විසින් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දැනට දරනු ලබන තනතුර හා දැනට සේවය කරනු ලබන අංශය :————.

4.2 ඔබ විසින් මුද්‍රණ ශිල්පය පිළිබඳව හදාරා ඇති පාඨමාලාවන් හා එම පාඨමාලා හදාරා ඇති ආයතන පිළිබඳ විස්තර

..........................................................

..........................................................

5.0 මුදල් කුවිතාන්සිය :

| (ලදුපත නොගැළවෙන සේ මෙහි අලවන්න)<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |
|---|

6.0 අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, අංක 1816/12 හා 2013.06.26 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා මුද්‍රණ සේවා ව්‍යවස්ථාවට අනුව මෙම තනතුරට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් මා විසින් සපුරා ඇති බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ...........හා ...........වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද, විභාග නීතිරීති වලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (දැන්වීමේ 9 (ඈ) පරිදි විය යුතු ය.)

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන........................ (සම්පූර්ණ නම) යන අය රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්............ දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේදී තැබූ බවත් මම සහතික කරමි.

————,
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන)

දිනය :————.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි)

8.0 අයදුම්කරු සේවය කරන අංශය භාර මාණ්ඩලික නිලධාරියාගේ සහතිකය :

මෙම අයදුම්කරු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ................. අංශයේ ................. තනතුරක් දරන නිලධාරියකු වශයෙන් සේවය කරන බවට සහතික කරමින්, ඔහුගේ මෙම අයදුම්පත ඉදිරි කටයුතු සඳහා ඉදිරිපත් කරමි.

————,
(අංශ භාර මාණ්ඩලික නිලධාරියාගේ අත්සන)

දිනය :————.
අංශ භාර මාණ්ඩලික නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි)

8.0 පෞද්ගලික ලිපිගොනු භාර මාණ්ඩලික නිලධාරියාගේ සහතිකය :

මෙම නිලධාරියා අංක 1816/12 හා 2013.06.26 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා මුද්‍රණ සේවා ව්‍යවස්ථාවට අනුව ඉහත 3.0 හි සඳහන් තනතුරට ඉල්ලුම් කිරීමට අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති බවත්, ඔහු/ඇය විසින් සඳහන් කර ඇති කරුණු නිවැරදි බවත්, ඔහු/ඇය 2014 ......... දින සිට පූර්වාසන්න වසර 05 ක් තුළ කිසිදු විනය නියෝගයකට යටත් නොමැති බවත්, එසේ කිරීමට අදහස් කර නොමැති බවත් ඉහත දිනට පූර්වාසන්න වසර පහක කාලයක් තුළ සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති බවත් සහතික කරමි.

————,
(පෞද්ගලික ලිපිගොනු භාර මාණ්ඩලික නිලධාරියාගේ අත්සන)

දිනය :————.
පෞද්ගලික ලිපිගොනු භාර මාණ්ඩලික
නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි)

06-214

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.